සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

43 S I

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**First Term Test - Grade 13 - 2019**

විභාග අංකය .............................

## ක්‍රිස්තියානි ධර්මය I

කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයකට 1,2,3,4,5 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ලකුණු කරන්න.**

01. ජේසුස් වහන්සේ ස්වර්ගාරෝහණය වන අවස්ථාවේ අපෝස්තුළුවරුන්ට වදාළ පණිවිඩය යථාර්ථයක් වූ ආකාරය ගෙනහැර දක්වා ඇති කෘතිය වන්නේ,
1. එළිදරව්ව
2. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොත
3. ශු. ලූක් සුබ අස්න
4. ශු. මතෙව් සුබ අස්න
5. හෙබ්‍රෙව් (.....)

02. ආදිපීතෘ ජාකොබ්ගේ පුත් ජෝසප් ඉෂ්මායෙල්වරුන්ට විකුණූ 'දොතාන්' පිහිටියේ,
1. සමාරියාවේ මධ්‍යම කඳුකරයේ
2. පිලිස්ති මිටියාවතේ
3. ජුදා කඳුකරයේ
4. වෙරළබඩ තීරුවේ
5. දකුණු ගලීලයේ (.....)

03. ජෙරුසලම හා ඔලිව් කන්ද අතර පිහිටා තිබුණේ,
1. ගෙහෙන්නා නිම්නය
2. බෙතානිය
3. මළ මුහුද
4. කිද්‍රෝන් ඇල
5. ෂාරෝන් මිටියාවත (.....)

04. ජුදා දේශය පාලනය සඳහා හුල්දා, නාහුම්, ශෙපනියා හබකුක් හා ජෙරමියා යන දිවැසිවරුන්ගේ සහය ලබාගත් රජතුමා වන්නේ,
1. ජෙහෝයාකිම් රජ
2. ශෙදකියා රජ
3. ජෙහෝයාකින් රජ
4. නෙබුකද්නෙශර් රජ
5. ජොෂියා රජ (.....)

05. දෙවියන් වහන්සේ දූවිල්ලෙන් මිනිසා මැවීම තුළ උන්වහන්සේට ආරූඪ කර ඇති මානව රූපී සංකේතය වන්නේ,
1. කුඹල්කරුවෙක්
2. වැව්ලි කරුවෙක්
3. උයන් පාලකයෙක්
4. ශල්‍ය වෛද්‍යවරයෙක්
5. ඇඳුම් මසන්නෙක් (.....)

06. හොඳ නරක අවබෝධ කර ගැනීමේ වෘක්ෂය පිහිටුවීම යනුවෙන් අදහස් කරනුයේ,
1. දේව ආධිපත්‍යය පිළිබිඹු කිරීම.
2. නිදහස මැවීම.
3. මිනිසා තුළ බය ඇති කිරීම.
4. මිනිසාට නීති පැනවීම.
5. මිනිසා පරීක්ෂාවට පැමිණවීම. (.....)

07. ''ඇට ස්ත්‍රිය කියා කියනු ඇත'' මෙම ප්‍රකාශයෙන් පෙන්නුම් කරනුයේ,
1. පුරුෂයාගේ ආධිපත්‍යය.
2. ස්ත්‍රියට පුරුෂයා නම් තැබූ බව.
3. ස්ත්‍රිය මිනිසාගේ නිර්මාණයක් බව.
4. ස්ත්‍රිය, පුරුෂයා සම තත්වයට උරුමකම් කියන බව.
5. ස්ත්‍රිය පුරුෂයාට යටත් විය යුතු බව. (.....)

08. රුචියේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,
1. සිත ඇදී යාම. 2. ව්‍යාජ බව.
3. යථාර්ථය තේරුම්ගත නොහැකි වීම. 4. සිත රැවටීම.
5. ඇත්ත ඇති සැටියෙන් දැකීම. (.....)

09. කායින් ලැබූ දඬුවම ආදම්, ඒව ලැබූ දඬුවමින් වෙනස් වන්නේ,
1. තමාගේ වාස භූමියෙන් නෙරපා දැමීම නිසාය.
2. වාසස්ථානය අහිමි වූ නිසාය.
3. ඔහු දෙවියන් වහන්සේට දුන් පිළිතුර නිසාය.
4. දෙවියන් වහන්සේ සම්පූර්ණවම ඔහුව ඇතහැර දැමූ නිසාය.
5. ඔහු සාප ලද්දෙක් වීම නිසාය. (.....)

10. පර්සියානු යුගයේදී බබිලෝනියේ ජීවත් වූ ජුදෙව්වන් අදියර තුනක් යටතේ තම මව්බිම කරා පැමිණෙන ලදී. ඒ අනුව ක්‍රි.පූ. 444 දී තෙවන කණ්ඩායම රැගෙන ඒමට මූලික වූ පුද්ගලයා වන්නේ,
1. එස්රා. 2. සෙරුබ්බාබෙල්. 3. ජෝෂුවා.
4. එස්තර්. 5. නෙහෙමියා. (.....)

11. ජේසුස් වහන්සේගේ උපතේදී කුඩා පිරිමි දරුවන් මරණයට පත් කළ රජතුමා වන්නේ,
1. හෙරෝද් ඇන්ටිපස් 2. ආර්කෙලාවුස් 3. මහා හෙරෝද්
4. දෙවන හෙරෝද් පිලිප් 5. පොන්තියුස් පිලාත් (.....)

12. ජල ගැල්මෙන් පසු පාපය තවදුරටත් පැවතියද, නැවත ලොව ජලයෙන් විනාශ නොකිරීමට දෙවියන් වහන්සේ දෙනු ලබන ප්‍රතිඥාවෙන් පෙන්වා දෙනුයේ,
1. ජල ගැල්ම ඉතා බරපතලව සිදුවී ඇති බව.
2. දෙවියන් වහන්සේගේ ආධිපත්‍ය ක්‍රියාත්මක වන ආකාරය.
3. දෙවියන් වහන්සේ ද්විපාර්ශ්වික ගිවිසුමක් කරන බව.
4. දේව සංරක්ෂණය මතු පාපයට ගොදුරුවන මිනිසාටද ලැබෙන බව.
5. ජලගැල්ම බයිබලීය ඉතිහාසයේ ආදර්ශමත් කතාවක් බව. (.....)

13. ගැලවීමේ ඉතිහාසයේ මුල් යුගයේදී දෙවියන්වහන්සේ විසින් තෝරා ගන්නා ලද පුද්ගලයන්ගේ නම් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
1. ආබ්‍රහම්, ඊසාක්, ජාකොබ් 2. සාවුල්, දාවිත්, සලමොන්
3. යෙසායා, ජෙරමියා, එසකියෙල් 4. ශු. ලූක්, ශු. මාක්, ශු. මතෙව්
5. දෙබෝරා, ගිඩියොන්, සැම්සොන් (.....)

14. මිනිසාට දෙවියන් වහන්සේ ලබාදෙන කැඳවීම අවබෝධ කර ගැනීමට හැකිවන ශක්තිය ක්‍රියාත්මක වන්නේ,
1. මිනිසාගේ තලෙන්තු මත 2. මිනිසාගේ බුද්ධිය මත
3. දෙවියන් කෙරෙහි ඇති විශ්වාසය මත 4. මුහුණ දෙන පරීක්ෂා මත
5. මිනිසාගේ රුචිය මත (.....)

15. පංච පුස්තකය තුළ එකම සිද්ධිය දෙයාකාරයකින් විස්තර කර ඇති බවට උදාහරණයක් ලෙස හඳුනාගත හැකි වන්නේ,
1. බාබෙල්කොත ගොඩ නැඟීම 2. දස පණත පිළිබඳ සඳහන
3. කායින් හා ආබෙල්ගේ කතාව 4. ආබ්‍රහම් තුමාගේ කැඳවීම
5. නෝවා නැව සෑදීම. (.....)

16. ආබ්‍රහම්, ඊසාක්, ජාකොබ්, යන ආදි පීතෘවරුන් දෙවියන් වහන්සේ අත්දුටු ස්ථාන පිළිවෙළින් සඳහන් පිළිතුර වන්නේ,
1. හෙබ්‍රොන්, බෙයර්ෂෙබා, බෙතෙල් 2. බෙයර්ෂෙබා, හෙබ්‍රොන්, බෙතෙල්
3. බෙතෙල්, බෙයර්ෂෙබා, හෙබ්‍රොන් 4. බෙයර්ෂෙබා, බෙතෙල්, හෙබ්‍රොන්
5. බෙතෙල්, හෙබ්‍රොන්, බෙයර්ෂෙබා (.....)

17. මෝසෙස් තුමා විවාහ කරගත් ජෙත්රෝගේ දියණිය වන්නේ,
1. මීකල් 2. ශිප්පොරා 3. මීරියම්
4. ජොකෙබෙද් 5. බැත්ශෙබා (.....)

18. මෝසෙස් පාරාවෝරජු මුණ ගැසී අනතුරු අඟවමින් මතු සිදුවන්නට යන දේ පවසන පීඩාවන් ලෙස හඳුනාගත හැකි වන්නේ,
1. පළමු, දෙවන, තෙවන පීඩා
2. පළමු, සිව්වන, සත්වන පීඩා
3. තෙවන, පස්වන, සයවන පීඩා
4. තෙවන, සයවන, නමවන පීඩා
5. දෙවන, පස්වන, අටවන පීඩා (.....)

19. පැරණි ගිවිසුම් තුළ පැවති දිවැසිවරයෙහි ඇති විශේෂත්වය වන්නේ,
1. දිවැසිවරු තම කැඳවීම කුඩා කල සිටම හඳුනා ගැනීම.
2. කැඳවීම ලද සැනින් කැඳවීම පිළිගැනීම.
3. එකම දෙවියන් වහන්සේගේ නියෝජිතයින් ලෙස දේව පණිවිඩය ප්‍රකාශ කිරීම.
4. ජනතාවසියල්ලන් දිවැසිවරුන්ව පිළිගැනීම.
5. දිවැසිවරු දීර්ඝ කාලයක් ජීවත් වීම. (.....)

20. පැරණි දිවැසිවරු කළ කී දෑ සඳහන් වන ශු. බයිබලයේ ග්‍රන්ථ වන්නේ,
1. වංශාවලිය, මකබි
2. රාජාවලිය, සාමුවෙල්
3. වීරාවලිය, ධර්මදේශකයා
4. උපදේශකයා, බාරුක්
5. සිරාක්, තෝබීත් (.....)

21. ජෙබුසිවරුන්ගේ නගරය ලෙස හඳුන්වන්නේ,
1. නාසරෙත්
2. බෙත්ලෙහෙම
3. ගලීලය
4. ජොර්දානය
5. ජෙරුසලම (.....)

22. සෙමතික් ජන වර්ගයට අයත් මෙන්ම ආබ්‍රහම් පරපුරේ නෑකම් ඇති පිරිසක් වන්නේ,
1. කානානිවරු
2. මිසර වැසියන්
3. පිලිස්තිවරු
4. හික්සොස්වරු
5. අමෝරිවරු (.....)

23. ප්‍රඥා සාහිත්‍ය කේන්ද්‍ර කරගනුයේ,
1. රූප වන්දනාවට විරුද්ධ ඉගැන්වීම්.
2. ගිවිසුම් සංකල්පය
3. දේව මාලිගාව
4. දේව මාළිගයේ වන්දනාව
5. මිනිසා හා යහපත් ජීවිතයක් ගත කිරීම. (.....)

24. ගීතාවලියෙහි ගීතිකා වර්ගීකරණයෙහි දෙවියන් වහන්සේගෙන් ලද වරප්‍රසාද හෝ දීමනා වෙනුවෙන් කෘතඥතාවය ප්‍රකාශ කිරීමට භාවිත වූ ගීත වන්නේ,
1. ප්‍රශංසා ගීත.
2. ප්‍රඥා ගීත
3. විශ්වාසයේ ගීත
4. වන්දනා ගීත
5. තුති දීමේ ගීත (.....)

25. දිවැසිවර හොසියා වෙනත් දෙවිවරුන්ට වන්දනා කිරීමේ පාපය හඳුන්වන්නේ,
1. වෙශ්‍යාකමක් ලෙසිනි.
2. දිළිඳුන් සූරාකෑමක් ලෙසිනි.
3. වියළි ඇටකටු ඇති මිටියාවතක් ලෙසිනි.
4. විප්‍රවාසයක් ලෙසිනි.
5. බිලි පූජාවක් ලෙසිනි. (.....)

26. 'මරියා වඩා යහපත් දේ තෝරා ගෙන ඇත'' (ලූක් 10, 42) යනුවෙන්පවසමින් ක්‍රිස්තුන් වහන්සේ මරියාගේ ක්‍රියාව ප්‍රශංසාවට ලක් කළේ,
1. ජෙරිකෝවේ දී.
2. බෙතානියේ දී.
3. සමාරියේ දී.
4. එම්මාවුස්හි දී.
5. කායිසාරියේ දී. (.....)

27. සමරිතානුවන් අන්‍යජාතීන් හා මිශ්‍ර වූ අපවිත්‍ර සෙනගක් ලෙස නින්දා වින්දේ,
1. අසිරියානු විප්‍රවාසයෙන් පසුව.
2. බැබිලෝනියානු විප්‍රවාසයෙන් පසුව.
3. මිසරයේ වහලුන් බවට පත්වීමෙන් පසුව.
4. මෙසපොතේමියාවේ වහල් සේවයට යාමෙන් පසුව.
5. සිරියාවේ විප්‍රවාස ගතවීමෙන් පසුව. (.....)

28. වරදකරුවෙකු ලෙස චෝදනා ලැබූ ක්‍රිස්තුන් වහන්සේව ප්‍රථමයෙන් විනිශ්චයට ලක්වූයේ,
1. ආණ්ඩුකාර පිලාත් ළඟදී.
2. උත්තම පූජකයාගේ මැදුරේදී.
3. සැන්හෙන්ඩ්‍රික් මන්ත්‍රණ සභාවේ දී.
4. ජෙරුසලම් දේව මාළිගාවේදී.
5. සිනගෝගයේ දී. (.....)

29. පරිසිවරුන් අතේ හා නළලේ දේවවචනය සටහන්කර ගනිමින් මවා පාන්නට උත්සහ කළේ,
1. මළවුන්ගෙන් නැගිටීම පිළිබඳව ඇති විශ්වාසය.
2. මෙසියස් වහන්සේගේ ආගමනය බලාපොරොත්තුවෙන් සිටින බව.
3. ධාර්මිකව දිවි ගෙවන බව.
4. ව්‍යවස්ථාව අකුරට පිළිපදින බව.
5. චාරිත්‍රානුකූල ආගමික පිළිවෙත් ඉතා වැදගත් කොට සළකන බව. (.....)

30. නුසුදුසු පූජකවැන් පත්වීම නිසා, දේවමාළිගාව අපිරිසිදු තත්ත්වයට පත්වී ඇති බවපවසමින්, දේව මාළිගාවත්, පූජකවරයත් යන දෙකම ප්‍රතික්ෂේප කළ ජුදා ආගමික කණ්ඩායම වන්නේ,
1. පරිසිවරුන්. 2. විනයධරයන්. 3. සෙලට්වරුන්.
4. එසේනිවරුන්. 5. සද්දුසිවරුන්. (.....)

31. ''දෙවිඳුන් විසින් ආදරය කරනු ලබන්නා'' යන අරුත ගෙන එන ග්‍රීක පදය වන්නේ,
1. එවුඅන්ගේලියොන් 2. ප්‍රොෆෙටේස් 3. මකාරියෝයි.
4. කයිරොස් 5. තියෝපිලස් (.....)

32. මිනිසත්බව ගත් දේවපුත්‍ර ජේසුස් වහන්සේ ඔලිව් කන්දේ දී යාච්ඤා කරනවිට, දාබිඳු, රුධිරය මෙන් ගලා ගිය බවට දක්වන එකම කතුවරයා වන්නේ,
1. ශුද්ධ වූ මතෙව්තුමා 2. ශුද්ධ වූ මාක්තුමා. 3. ශුද්ධ වූ ලූක්තුමා
4. ශුද්ධ වූ ජොහාන්තුමා. 5. ශුද්ධ වූ පාවුලුතුමා. (.....)

33. ශුද්ධ වූ පාවුලුතුමා හා බර්ණබස්තුමන්ව දේවත්වයෙන් පිදීමට ජනතාව පෙළඹුණේ කුමන සිද්ධියක් අරඹයාද?
1. බාර් ජේසුස් අන්ධභාවයට පත් වූ නිසා.
2. ලුස්ත්‍රාවේ කොර වූ මිනිසා සුවපත් කළ නිසා.
3. යුනිකස්ට පණදීම නිසා.
4. ලිදියාගේ නිවසේ ගෘහස්ථ සභාවක් ආරම්භ කිරීම නිසා.
5. ස්කේවා නම් පූජකයාගේපුතුන් හා සංචාරක යකැදුරන් සම්බන්ධ සිදුවීම නිසා. (.....)

34. ශුද්ධ වූ මතව්තුමා දහතුන්වන පරිච්ඡේදයේ ඉදිරිපත් කරන උපත පිළිබඳ දේශනාවන් අධ්‍යයනය කිරීමෙන් අපට උගත හැකි වන්නේ,
1. දේව රාජ්‍යයේ ශුද්ධත්වය පිළිබඳව.
2. දේව රාජ්‍යය සම්බන්ධ දූත මෙහෙය පිළිබඳව.
3. දේව රාජ්‍යයේ ස්වභාවය පිළිබඳව.
4. දේව රාජ්‍යයේ අධිකාරී බලය පිළිබඳව.
5. දේව රාජ්‍යයේ අනාගතය පිළිබඳව. (.....)

35. ''මා කෙරෙහි අදහාගත් මේ බාලයන්ගෙන් එකෙකුවත් නොමග යවන යමෙක් වේද, ඔහුගේ ගෙළ වටා මහා ඇඹුරුම් ගලක් එල්ලා මුහුදු ගැඹුරෙහි ගිල්වා දැමීම ඔහුට යහපත'' (මතෙව් 18, 6) යන ශුද්ධ ලියවිලි පාඨයෙහි දැක්වෙන 'බාලයන්' යන පදයෙන් අර්ථ දැක්වෙන්නේ කවුරුන් පිළිබඳවද?
1. කුඩා දරුවන් 2. සමාජයෙන් කොන්වූ ජනතාව
3. ධර්මදානයේ යෙදෙන්නන් 4. තෝරාගත් දේව ජනතාව
5. ක්‍රිස්තු අනුගාමිකයන් (.....)

36. ක්‍රි.ව. 6-15 දක්වා කාලය තුළ සැන්හෙන්ඩ්‍රින් මන්ත්‍රණ සභාවේ උත්තම පූජක තනතුර දැරුවේ,
1. අන්නාස්. 2. කායාපස්. 3. මල්කුස්.
4. හෙරෝද්. 5. පිලාත්. (.....)

37. ක්‍රිස්තුන් වහන්සේ පව්කරුවන්ගේ අනන්‍යතාව ලබාගත් බව ප්‍රකාශ වන්නේ,
1. ගවලෙනක ඉපදීමෙනි.
2. බෞතීස්ම ස්නාපනය ලැබීමෙනි.
3. පවුකරුවන් සමග කෑම ගැනීමෙනි.
4. කුරුසයේ මරණයට පත්වීමෙනි.
5. ගල්ලෙනක තැන්පත් කිරීමෙනි. (.....)

38. ශුද්ධස්ථානය, අතිශුද්ධස්ථානයෙන් වෙන් කිරීමට යොදාගත් දේව මාළිගා තීරය දෙකඩවීම මගින් පැහැදිලි වන්නේ,
1. මෝසෙස්ගේ ව්‍යවස්ථාව අලවංගු වූ බව.
2. නව ගිවිසුමේ ප්‍රෞඪ ආරම්භය.
3. දෙවියන් වහන්සේ වෙතට යාමේ මාර්ගය විවෘත වූ බව.
4. දේව රාජ්‍යය විශ්වීය සංකල්පයක් බව.
5. ක්‍රිස්තුන් වහන්සේ සැබවින්ම දේව පුත්‍රයා බව. (.....)

39. ක්‍රිස්තුන් වහන්සේගේ බලය, කීර්තිය හා ධනය ප්‍රතික්ෂේපිත රාජ්‍යයක් වන බව තහවුරු වන සිද්ධිය වන්නේ,
1. පාළුකරයේ පරීක්ෂාවන්ට මුහුණ දීම.
2. කන්ද උඩ දේශනාව
3. මරණය පරාජය කොට උත්ථානවීම.
4. දෙවියන් වහන්සේගේ දකුණු පස වැඩ සිටීම.
5. උත්තම පූජක යැදුම. (.....)

40. ප්‍රසාද ස්නාපනය ලබන කිතුනුවා පොදු පූජකවරයේ වගකීම ඉටු කරමින් දිව්‍ය පූජාව වේලාවේ දී අන් අය වෙනුවෙන් යාච්ඤා කරන අවස්ථාව වන්නේ,
1. හැඳින්වීමේ දී.
2. පොදුයැදුමේ දී.
3. මැදිහත්වීමේ යැදුමේ දී
4. ස්වාමිවාක් ආරාධනාවේ දී.
5. පව් සමාවේ යැදුමේ දී. (.....)

41. ''මාංශය'' යන පදය සඳහා යෙදෙන පැරණිතම ග්‍රීක ව්‍යවහාරය වන්නේ,
1. සෝමා
2. සාර්ක්ස්
3. අගපේ
4. ත්‍රෝගයින්
5. කයිරෝස් (.....)

42. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීමේ සිද්ධිය ඉදිරිපත් කිරීමේ දී ශුද්ධ වූ පාවුලුතුමා අනුගමනය කරන්නට ඇතැයි සිතිය හැකි සම්ප්‍රදාය වන්නේ,
1. එලොහිම් සම්ප්‍රදාය.
2. සිරියාවේ අන්තියෝකියානු සම්ප්‍රදාය.
3. යාවේ සම්ප්‍රදාය.
4. ජෙරුසලම් සම්ප්‍රදාය.
5. ද්විතීය නීති සම්ප්‍රදාය. (.....)

43. මුල් කිතුනුවෝ දේව නමස්කාරය සඳහා එකතුවූයේ,
1. කුඩාරමට හෝ නිවසට ය.
2. සිනගෝගයට හෝ සැන්හෙන්ඩ්‍රික් සභාවට ය.
3. උත්තම පූජක මැදුරට හෝ දේව මාළිගාවට ය.
4. ශුද්ධස්ථානයට හෝ අතිශුද්ධස්ථානයට ය.
5. දේව මාළිගාවට හෝ ධර්ම ශාලාවට ය. (.....)

44. සමාජ සේවාව සසඳහා පත් කෙරුනු තේවාචාර්යවරුන් අතරින් ස්තේපන් හා පිලිප්ට පැවරුණු විශේෂිත කාර්යයන් වන්නේ,
1. භාවනාවේ යෙදීම හා දේව වාක්‍ය කියවීම.
2. රොටී කැඩීම හා යාච්ඤා කිරීම.
3. පව්කමා කිරීමේ බලය හා ඉගැන්වීම.
4. සුබ අස්න දේශනා කිරීම හා බෞතීස්ම ස්නාපනය.
5. නායකත්වය දීම හා දේව මෙහෙයක් පැවැත්වීම. (.....)

45. තමන්ව දේවත්වයෙන් නමස්කාර කිරීමට නියෝග කර, එසේ නොකරන අයව අදේවවාදීන් ලෙස හඳුන්වා දඬුවම් ලබා දුන්නේ,
1. නීරෝ අධිරාජ්‍යයා.
2. ඩොමිෂියන් අධිරාජ්‍යයා.
3. ට්‍රාජන් අධිරාජ්‍යයා.
4. මාකස් අවුරේලියස් අධිරාජ්‍යයා.
5. ඩෙසියස් අධිරාජ්‍යයා. (.....)

46. පහත දැක්වෙන්නේ කිතුනු සභාවේ පීඩන යුගය තුළ කිතුනුවන් මුහුණදුන් සිද්ධි කිහිපයකි.
a) ලිබෙලුස් සහතිකය ලබා ගැනීමට අනිවාර්ය කිරීම.
b) ශුද්ධ වු පේදුරුතුමා හා ශුද්ධ වු පාවුලුතුමන්ව ඝාතනය කිරීම.
c) පැවිදි පූජක කණ්ඩායම් සිරගත කිරීම.
d) කිතුණුවන් පීඩාවලින් මිදීමට වනගත වී තපස් රැකීම.
e) ශුද්ධ වු ඇලෙක්සැන්ඩර්තුමා ප්‍රාණ පරිත්‍යාගී වීම.
ඉහත සඳහන් කරුණු අතරින් ඩෙසියස් අධිරාජ්‍යයාගේ සමයේ දී පැවති පීඩන ඇතුළත් පිළිතුර තෝරන්න.
1. a, b හා c ය.
2. a, d හා e ය.
3. b, d හා e ය.
4. c, d හා e ය.
5. b, c හා d ය. (.....)

47. ''ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි'' (මාක් 1, 11) යන දේව ප්‍රකාශනය නිවැරදිව තේරුම් ගැනීමට නම් අප අධ්‍යයනය කළයුතු වන්නේ,
1. හිතෝපදේශය හා සලමොන්ගේ ප්‍රඥාව.
2. ජෝබ් හා ජෙරමියා ග්‍රන්ථයන්.
3. ගීතාවලිය හා යෙසායා ග්‍රන්ථයන්.
4. ප්‍රේම ගී හා ද්විතීය නීති සංග්‍රහය.
5. නික්මයාම හා ලෙවී කතාව. (.....)

48. දේව සේවයේ යෙදෙන්නා ඉවසීම ප්‍රගුණ කළයුතු බව උගන්වන්නේ ශුද්ධ වූ පාවුලුතුමාගේ මෙම ග්‍රන්ථයෙනි,
1. තිමෝති පළමු හසුන 2. තිමෝති දෙවන හසුන 3. පිලමොන් හසුන
4. ගලාති හසුන 5. රෝම හසුන. (.....)

49. අන්තියෝකියානු සම්ප්‍රදායට අනුව රොටිවලින් සංකේතවත් වන්නේ,
1. නව ගිවිසුමක් පිහිට වූ බවය.
2. ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය යාගයක් වන බවය.
3. අතීත සිදුවීමක් වර්තමානයේ ජීවමාන කරවන බවය.
4. එකමුතුකමේ භෝජන සංග්‍රහයක් ස්ථාපිත වූ බවය.
5. පූපය ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය බවට පරිවර්තනය වන බවය. (.....)

50. පළමු වන හෙරෝද් අග්‍රිපා රජ සමයේ ප්‍රාණ පරිත්‍යාගී වූ අපෝස්තුළුතුමන් වන්නේ,
1. ශු. ජොහාන්තුමා.
2. ශුද්ධ වූ පේදුරුතුමා
3. ශුද්ධ වූ පිලිප්තුමා
4. ශුද්ධ වූ මහා ජාකොබ්තුමා.
5. ශුද්ධ වූ ස්තේපන්තුමා (.....)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved



43 S II

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

First Term Test - Grade 13 - 2019

විභාග අංකය .............................

# ක්‍රිස්තියානි ධර්මය II

කාලය පැය තුනයි

වැදගත්

I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

## I කොටස

01. (i) වීර නායකයන් දෙදෙනෙක් නම් කරන්න.
(ii) වීර නායකයන්ගේ පාලනයේ පැවති දුර්වලතා දෙකක් සඳහන් කරන්න.
(iii) සාමුවෙල් දිවැසිවරයාගෙන් ඊශ්‍රායෙල් ජනතාව රජෙකු ඉල්ලීමට බලපෑ ප්‍රධාන කරුණු තුනක් ලියන්න.
(iv) කිතුනුවෙකු ලෙස තම රට හා සමාජයේ යහපත උදෙසා ඔබට කළහැකි කාර්යයන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 2+4+6+8 = 20)

02. (i) මාක් සුවිශේෂය මූලික මූලාශ්‍රය වූ සුවිශේෂ ග්‍රන්ථ දෙකක් ලියන්න.
(ii) මාක් සුභාරංචිය ලිවීමේ පරමාර්ථ දෙකක් ලියන්න.
(iii) ක්‍රිස්තු ශ්‍රාවකයින්ගේ සැබෑ ජීවන මාර්ගය මාක් තුමා සිය සුභාරංචිය මගින් ඉදිරිපත් කරයි. ඒ සඳහා එතුමා යොදාගත් මූලික ලක්ෂණ තුනක් ලියන්න.
(iv) ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය හා මරණය තුළින් අපගේ ජීවිතය හා මරණය පිළිබඳ අර්ථාන්විතව අවබෝධ කරගැනීමට මෙම සුභාරංචිය මහත් පිටිවහලක් වූ බවට කරුණු හතරක් සඳහන් කරන්න.

03. (i) මුල් කිතුණුවෝ දයාසේවය සඳහා විශේෂ අවධානයක් හා සැලකිල්ලක් යොමුකළ පුද්ගලයන් දෙවර්ගයක් ලියන්න.
(ii) දයාසේවය සඳහා සහනාධාර කටයුතුවල යෙදීමට තේවාචාරීවරුන් පත්කිරීමට හේතු වූ කරුණු දෙකක් ලියන්න.
(iii) තේවාචරීවරුන් දයාසේවය සඳහා මුල් කිතුනුවන් අතින් පත්කිරීමේදී සලකා බැලූ මූලික සුදුසුකම් තුනක් ලියන්න.
(iv) තේවාචාර ස්තේපන්තුමාගේ ජීවිත ආදර්ශයට ගෙන සමාජ සේවය සඳහා ඔබට කළ හැකි දේවල් හතරක් ලියන්න.

## II කොටස

04. (i) ශුද්ධ බයිබලය ලේඛනගත කිරීමේදී මුල් වූ අරමුණු ලියා එය කිතුනු ජීවිතයට වැදගත් වන ආකාරය කරුණු පහක් ඔස්සේ පැහැදිලි කරන්න.

(ii) වර්තමාන සමාජය තුළ ජීවත්වන ඔබට දෙවියන් වහන්සේ අනාවරණය වන විවිධ මාර්ග පහක් සඳහන් කර දේව අනාවරණය විස්තර කරන්න. (මුළු ලකුණු 2 x 10 = 20)

05. (i) කාන්තාර ගමන තුළ ඊශ්‍රායෙල් ජනතාව අත්දුටු දිව්‍ය සංරක්ෂණය පසුබිම් කරගෙන සමාජ අභියෝග ඉදිරියේදී ඔබට අනුගමනය කළ හැකි මඟපෙන්වීම් පහක් විස්තර කරන්න.

(ii) ඊශ්‍රායෙල් ජනතාව ලද සීනයි ගිවිසුම (දස පනත) නූතන කිතුනුවාටද අත්‍යවශ්‍ය බව කරුණු පහක් මගින් පැහැදිලි කරන්න.

06. (i) වර්තමාන කිතුනු තරුණ සමාජයට බේද අමතක කර පොදු සහෝදරත්වයෙන් බැඳුණු ප්‍රේමයේ ජීවිතයක් ගත කිරීමට මග පෙන්වීම ශුද්ධ වූ පාවුළුතුමා කොරින්තිවරුන්ට ලියූ ලිපියේ සඳහන් ප්‍රේමයේ ලක්ෂණ පහක් ඔස්සේ පැහැදිලි කරන්න.

(ii) 'කිතුනු පවුල ශුද්ධ වූ සභාවේ ජීවනාලියයි'' යන්න ශුද්ධ වූ පාවුළුතුමා එපීසවරුන්ට ලියූ ලිපියේ සඳහන් කරුණු පහක් ඇසුරින් පැහැදිලි කරන්න.

07. (i) පීඩන යුගය තුළ කිතුනුවන් මුහුණ දුන් අධිරාජ්‍ය සමයන් පහක් ලියා, වර්තමාන කිතුනුවාට එල්ලවන ජීවන හා අභියෝග හමුවේ ඔබ කිතු දහමට සාක්ෂි දරණ ආකාරය පැහැදිලි කරන්න.

(ii) මුල් කිතුනු සභාවේ සත්‍යතා ආරක්ෂා කරගැනීමට උර දුන් සභාපියවරු පස් දෙනෙක් ලියා, ඔවුන්ගේ ආකල්ප හා ශුද්ධවන්ත ජීවිතය ආදර්ශයට ගනිමින් වර්තමාන සභාවේ සත්‍යතාවයන් ආරක්ෂා කර ගැනීමට ඔබ ගන්නා පියවර පැහැදිලි කරන්න.

08. (i) මුල් කිතුනු සභාවේ දක්නට ලැබූ විශේෂ ලක්ෂණ ලියා සභාව විජාතීන් වෙත පතළ වූ ආකාරය පැහදිලි කරන්න.

(ii) බහු ජාතික, බහු ආගමික රටක ජීවත් වන ඔබ අන්‍ය ආගමිකයින් වෙත කිතු දහමේ විශ්වාසය ගෙනයන ආකාරය කරුණු පහක් ඔස්සේ පෙන්වා දෙන්න.

# පළමු වාර පරීක්ෂණය - 2019
# ක්‍රිස්තියානි ධර්මය - 13 ශ්‍රේණිය
# I පත්‍රය
# පිළිතුරු

| | | | | |
|---|---|---|---|---|
| 01 - 2 | 11 - 3 | 21 - 5 | 31 - 5 | 41 - 2 |
| 02 - 1 | 12 - 4 | 22 - 4 | 32 - 3 | 42 - 2 |
| 03 - 4 | 13 - 1 | 23 - 5 | 33 - 2 | 43 - 5 |
| 04 - 5 | 14 - 3 | 24 - 5 | 34 - 3 | 44 - 4 |
| 05 - 1 | 15 - 2 | 25 - 1 | 35 - 5 | 45 - 2 |
| 06 - 2 | 16 - 1 | 26 - 2 | 36 - 1 | 46 - 3 |
| 07 - 4 | 17 - 2 | 27 - 1 | 37 - 2 | 47 - 3 |
| 08 - 3 | 18 - 5 | 28 - 3 | 38 - 3 | 48 - 2 |
| 09 - 5 | 19 - 3 | 29 - 3 | 39 - 1 | 49 - 2 |
| 10 - 5 | 20 - 2 | 30 - 4 | 40 - 3 | 50 - 4 |

(ලකුණු 1x2=100)

# ක්‍රිස්තියානි ධර්මය - 13 ශ්‍රේණිය.
# II පත්‍රය
## I කොටස

01. (i) ඔත්නියෙල්, ඒහුද්, ෂම්හර්, දෙබෝරා, බාරාක්, ගිඩියොන්

(ii) * පාලනය මුළු දේශය පුරාම පැතිර නොයාම.

* ජුදා ගෝත්‍ර හැම එකක්ම එක්සේසත් කිරීමට නොහැකිවීම.

(iii) * සාමුවෙල් වයස් ගතව දුර්වලවීම.

* සාමුවෙල්ගේ පුතුන් පියාගේ අඩිපාරේ නොගොස් වස්තු තණ්හාවෙන් අල්ලස් ගැනීම.

* වීරවරුන්ට අනෙක් රටවල රජවරු මෙන් ජනතාව එක්රැස් කිරීමටත් ජනතාවට ආරක්ෂාව සැපයීමටත් දේශය සංවර්ධනය කිරීමටත් නොහැකි වීම.

(iv) * රටේ සාමය ඇති කිරීමට කටයුතු කිරීම.

* ආගමික සහයෝගීතාවය දැක්වීමට විවිධ වැඩ සටහන් සංවිධානය කිරීම.

* විවිධ ජාතීන් වෙසෙන සමාජයක් නිසා සැමදෙනාම සහෝදර ප්‍රේමයෙන් පිළිගැනීම.

* රටේ නායකයින්ට ගරු කරමින් රටේ සමෘද්ධිය සඳහා ග්‍රාමීය මට්ටමින් සහයෝගය ලබාදීම..

ආදී කරුණු ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (මුළු ලකුණු 2+4+6+8 = 20)

02. (i) මතෙව්, ලූක් ශුභාරංචි

(ii) * නීරෝ අධිරාජ්‍යයින්ගේ පීඩන සමන්හි දිවිගෙවූ කිතු බැතිමතුන්ට අධ්‍යාත්ම වශයෙන් සැනසීමක් ලබාදීම.

* කිතුනුවන්ට කාලය ඉතා ලඟ බව දැක්වීම සඳහා මේ මගින් උත්සාහය දැරීම.

(iii) * උන් වහන්සේ සමඟ සිටීම, දේශනා කරනු ලබන පිරිස පිටතට යැවීම, යක්ෂ ආත්ම දුරුකරන පිණිස අධිකාරිත්වය ඇතිව සිටීම.

(iv) * ජේසුස් වහන්සේගේ මාර්ගය කිතුනුවන්ගේ මාර්ගය බව පෙන්වාදීම.

* කිතුනු ජීවිතයට ලැබෙන පීඩන, වේදනා, අභියෝග අධ්‍යාත්මික සැනසීමක් බව.

* ජේසුස් වහන්සේගේ මහිමාන්විත දෙවැනි පැමිණීමට අප සූදානම් විය යුතු බව.

* දේව පුත්‍රයා වූ ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාසය වර්ධනය කරනු ලබන බව.

(මුළු ලකුණු 2+4+6+8 = 20)

03. (i) වැන්දඹුවන්, අනාථවූවන්, වැඩිහිටියන්

(ii) * කිතුනුවන් ගණන වැඩිවීමේ දී සහනාධාර කටයුතුවල අඩුපාඩු ඇතිවීම.

* ග්‍රීක බස කතා කරන වැන්දඹුවන්ට හෙබ්‍රෙව් බස කතා කරන ජුදෙව්වන්ගෙන් අසාධාරණයක් වන බව ග්‍රීක බස කතා කරන ජුදෙව්වෝ පැමිණිලිකිරීම.

* ශුභ අස්නදේශනා කිරීම පසෙකලා සහනාධාර බෙදීමට අපෝස්තුලුවරුන් යොමුවීම.

(iii) * ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණවීම, ප්‍රඥාවෙන් පූර්ණවීම, යහපත් දිවි පෙවෙතක් තිබීම.

(iv) * සත්‍ය ඉදිරියේ නොබියව ඉදිරිපත්වීම. ජේසුස් වහන්සේ ඉගැන්වූ පරිදි ව්‍යවස්ථාවට වඩා ප්‍රේමයෙන් කටයුතු කිරීමට මූලිකත්වය දීම. තමන්ට වරද කරන අයට ජේසුස් වහන්සේ ඉදිරියේ සමාව දීම. දෙවියන් වහන්සේගේ කැමැත්ත පරිදි සියලු දේ අතහැර ජීවිතය පවා පරිත්‍යාගී කිරීමට සූදානම් වීම.. ආදී කරුණු ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (මුළු ලකුණු 2+4+6+8 = 20)

## II කොටස

04. (i) * ඉගැන්වීම, දුර්මත දුරුකිරීමට, හික්මවීමට, ධර්මිෂ්ට ජීවිතයක් ගත කිරීමට උපදෙස් දීමට.

* ශුද්ධ බයිබලය අනුසාරයෙන් අන් අයට ඉගැන්වීම.

* බයිබලය සිද්ධි, කතා ඇසුරෙන් ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීමට උපදෙස් දීම, මඟ පෙන්වීම.

* අන්‍ය ආගමිකයන්ගේ මතභේද වලට පිළිතුරු ශුද්ධ ලියවිල්ල ඇසුරෙන් ලබාදීම.

* තම ජීවිත අභියෝග ජය ලබාගන්න ශුද්ධ බයිබලය ඇසුරින් මඟ පෙන්වීම.

* ශුද්ධ බයිබලය අධ්‍යයනය කරන කිතුනුවාට දෙවියන් වහන්සේ අනාවරණවීම. මෙවැනි කරුණු ඔස්සේ පැහැදිලි කර තිබේනම් ලකුණු ලබාදෙන්න.

(ii) අභිරහසක්වන විශ්වයේ නිර්මාතෘවරයාණන් වන අදෘශ්‍යමාන දෙවිඳුන් දේව අනාවරණය දෙයාකාරයෙන් සිදු කරයි.

ස්වභාවධර්මය තුළින් හා ස්වභාව ධර්මයේ නීතිය ඉක්මවා විශේෂාකාරයෙන් සිදු කරන අනාවරණය.

විවිධ මාර්ග - ස්වභාධර්මය තුළින් (සුනාමිය, නියගය, ගංවතුර, විවිධ රෝග...ආදිය

ශුද්ධ බයිබල තුළ දේව වචනය

ආගමික නායකයින්

මිනිසා ලබන අත්දැකීම්

තම දෙමව්පියන් නෑදෑ හිතමිතුරන්, ගුරුභවතුන් විය හැක.

ඉහත පුද්ගලයන් හා ස්වභාව සිදුම් තුළින් දේව අනාවරණය විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.

(මුළු ලකුණු 2×10 = 20)

05. (i) කාන්තාර ගමන දී දෙවියන් වහන්සේ වැඩසිටිමින් ඔවුන්ට ශක්තියක් බලයක් වූ ආකාරය.

* මුහුද තරණය, වළා වැඩ හා ගිනිටැඹය, පාළුකරයේ ගමන, මාරා නැමැති ස්ථානයේදී පිපාසවීම සීන් කාන්තාරයේ දී ආහාර සැපයීම (මන්නා හා වටුවන්) මස්සා හා මෙරිබා ස්ථානවල ජලය ලැබීම, ලෝකඩ සර්පයා, ආක්‍රමණවලින් ආරක්ෂාවීම.

ඔවුහු කාන්තාර ගමන තුළ ස්වභාවධර්මය තුළින් දිව්‍ය සංරක්ෂණය අත්දුටුහ.

දේව හඬට අවනතවද දේව සැලැස්ම ඔස්සේ ද ගමන් කරන ජනතාවට දෙවියන්ගේ මහා කරුණාව ලබන සේක.

* දේව හඬට සවන්දීම. දේව සැලැස්මට පිටු නොපෑම, අභියෝග හමුවේ දෙවියන් කෙරෙහි විශ්වාසය තැබීමත් අවලාද නොකියාම, අපගේ ජීවිත මෙහෙයවීමට දෙවියන්ට ඉඩ හැරීම, දේව ආදරය අත්දැකීම තුළින් දෙවියන්ට ගරු බියපෑම.. මෙවැනි කරුණු ඔස්සේ පැහැදිලිකර තිබීම.

(ii) එඬේර ජීවිතයක් ගත කළ ඊශ්‍රායෙල් ජනතාව සුවිශේෂී ජනතාවක් බවට පත්වූයේ මේ සීනයි ගිවිසුම තුළින්ය.

ගෝත්‍රික ජනතාවක් වූ ඊශ්‍රායෙල් සෙනග සදාචාර සම්පන්න ජාතියක් බවට පත්වීම දේව ජනතාව අනන්‍යතාවය ලැබීම.

ඔවුන් සිනයි ගිවිසුම තුළින් විශේෂ වරප්‍රසාද ලද ත්‍රිවිධාකාර සම්බන්ධයක් ලබයි. දෙවියන් වහන්සේට අයිති සම්පතවීම, පූජක රාජ්‍යයක්වීම, ශුද්ධ වූ ජාතියක් වීම.

ඊශ්‍රායෙල් ජනයා සීනයි ගිවිසුම තුළින් ලද කැඳවීම නූතන කිතුනුවාටද ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළින් හිමිවේ.

මේ කරුණු අනුව නූතන කිතුනුවාට දසපනත අත්‍යවශ්‍ය වන ආකාරය පැහැදිලි කර තිබෙන කරුණු සලකා ලකුණු ලබාදෙන්න. (මුළු ලකුණු 2×10 = 20)

06. (i) ඉවසීම, කරුණාව, ඊරිසියා නොකිරීම, පාරට්ටු නොකිරීම, උඩගු නොවීම, හනික නොකිරීම. අවනත නොවීම, නපුර සිතේ තබා නොගනීම හරි දේ ගැන ප්‍රීති ඒ අනුන්ගේ වරදගැන ප්‍රීති නොවීම. පොදු සහෝදරත්වය තුළ ප්‍රේමයේ ජීවිතයක් ගත කිරීමට ඉහත ලක්ෂණ උපයෝගී කරගන්නා ආකාරය ආදී කරුණු සලකා බලා ලකුණු ලබාදෙන්න.

(ii) * කිතුනු පවුල් රාශියක් එක්ව ගොඩ නැගුණු දෙවියන් වහන්සේගේ විශේෂ පවුල ශුද්ධ වූ සභාවයි. එම නිසා පවුල් ජීවිතයද ශුද්ධ වූ සභාවේ ජීවිතයද අතර කිට්ටු සබඳතාවක් ඇත.

* ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර සම්බන්ධතාව ක්‍රිස්තුස් වහන්සේ හා සභාව අතර ඇති සම්බන්ධතාවයට සමානකරයි.මෙහි පදනම ආදරය.

* ස්වාමි පුරුෂයා හා භාර්යාව තුළ පරිත්‍යාගී ආදරයක් තිබිය යුතුය. ක්‍රිස්තුන් වහන්සේ සභාවට ප්‍රේමකලාක් මෙන්.

* ක්‍රිස්තුන් වහන්සේ සභාවේ හිස වන්නා සේ ස්වාමිපුරුෂයාද භාර්යාවගේ හිසය මෙය ප්‍රේමයේ නායකත්වයයි.

* සභාව ක්‍රිස්තුන් වහන්සේට යටත්වන්නා සේ භාර්යාවද ස්වාමි පුරුෂයාට යටත් වීම. ප්‍රේමය නිසා ඇතිවන පහන් භාවයකි.

* විවාහයේ ප්‍රධාන අරමුණ දරුවන් බිහිකිරීම හා ඇතිදැඩි කිරීමය. (කිතුනු වටිනාකම් හා කිතුනු විශ්වාසය තුළ) මෙවන් ගුණාංග වලින් සැදුම්ලත් පවුල ශුද්ධ වු සභාවේ ජීවනාලිය වනඅයුරු විස්තර කර ඇති ආකාරය බලා ලකුණු ලබාදෙන්න. (මුළු ලකුණු 2×10 = 20)

07. (i) නීරෝ අධිරාජ්‍ය සමය, ඩොමීනියන් අධිරාජ්‍ය සමය, ට්‍රාජන් අධිරාජ්‍ය සමය, මාකල්අවුරේලියස් අධිරාජ්‍ය සමය, සෙප්ටිමස් සෙවරස් අධිරාජ්‍ය සමය, මැක්සිමිනන් අදිරාජ්‍ය සමය ආදී අධිරාජ්‍ය සමයන් ලියාතිබීම.
සිසුවා සාක්ෂි දරණ ආකාරයලියා ඇති කරුණු දෙස බලා ලකුනු ලබාදෙන්න.

(ii) ශු. ජොරොම් තුමා, ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශුද්ධ වු අතානසියුස්තුමා, ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල් තුමා, ශු. අගෝස්තීනුතුමා, ටර්ටුලියන් තුමා ප්‍රාණපරිත්‍යාගි ශු. ජස්ටින් තුමා... ආදී සභාපියවරු.

* ලිපිලිවීමේදී කාලෝචිත සේවා ඔස්සේ ලියවීම.

* කිතුනුධර්මයට එරෙහි වූ භේදභේද දුර්මත චෝදනා හා අභියෝගවලට ප්‍රතිචාර දැක්වීමටහා කරුනු පහදාදීමට ඉදිරිපත්වීම යොදාගත් ක්‍රමවේදය තර්ක කිරීම ස්වභාවයක් තිබීම.

* අන්‍ය ආගමික උගතුන්ට ක්‍රිස්තියානි ධර්මය වටහා ගැනීමට මග පෙන්වාදීම.

* අන්‍ය ආගමිකයින් කිතුනුවන් පීඩාවට ලක්කිරීමට හේතු නැති බව පෙන්වාදීම.

* ජීවිත පරිවර්තනයක් සිදුවීම වැදගත් බව. (ශුද්ධවන් ජීවිතය)

* දේව ආදරයට සාක්ෂි දැරීම.

* ප්‍රාණ පරිත්‍යාගීවීමට වුවත් සූදානම් වීම.

මෙවැනි කරුණු ඔස්සේ සිසුවා ලියා ඇති ආකාරය බලා ලකුණුලබාදෙන්න. (මුළු ලකුණු 2×10 = 20)

08. (i) අපෝස්තුළුවරුන්ගේ ඉගැන්වීමද, සහභාගිකමහිද, රොටී කැඩීමේදී යාච්ඤාවෙහිද, අදහාගත් සමූහයා තමාට අයිති දේ පොදුවේ තබා ගැනීම.. ආදී කරුණු හේතු කොටගෙන එක් පවුලක් ලෙස එක් සමූහයක් ලෙස දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් අන් අයගේ අවශ්‍යතා උදෙසා කැපවීම මුල්කිතුනු සභාව තුළ කැපී පෙනුණි. මෙලෙස සභාව දේව අනුග්‍රහය හා ආශිර්වාදයමත දිනෙන් දින වර්ධනය විය.

* සභාව විජාතීන් වෙත පහළ වීමද.. සමාරියේ දහම් දෙසීම පිලිප්තුමා හා එතියෝපීය නපුංසකයා, පේදුරුතුමා හා කොර්නේලියස් ප්‍රාණපරිත්‍යාගී වූ ජාකොබ් තුමා, ස්තේපන්තුමා... ජෙරුලසම් මන්ත්‍රණ සභාව(චර්මඡේදන ගැටළුව විසඳීම)... යන කරුණු ඔස්සේ සිසුවා පැහැදිලි කර ඇති ආකාරය බලා ලකුණු ලබා දෙන්න.

(ii) සිසුවා ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබාදෙන්න. (මුළු ලකුණු 2×10 = 20)